වාර්ෂික වාර්තාව - 2016

ஆண்டு அறிக்கை -2016

ANNUAL REPORT -2016

ඇල්කඩුව වැවිලි සමාගම

எல்கடுவ பிளான்டேசன் லிமிடெட்

ELKADUWA PLANTAIONS LIMITED

“ජනවතු පියස” නො 320,ටී.බී. ජයා මාවත ,කොළඹ10.

“ஜனவது பியச”இல,320, T.B. ஜயாமாவத்தைஇ, கொழும்பு 10

“JANAWATHU PIYASA” NO 320, T.B.JAYAMAWATHA, COLOMBO 10

පටුන

දැක්ම, මෙහෙවර හා සාරධර්ම (1)

ආයතන ආකෘතිය (2-3)

සංධිස්ථාන (4)

මූල්‍යමය ඉස්මතුකිරීම් (5)

මෙහෙයුම් ඉස්මතුකිරීම් (6-8)

සභාපතිතුමාගේ සමාලෝචනය (9)

බාන්ඩික තොරතුරු (10)

අධ්‍යක්ෂ මණ්ඩලය (11)

කළමනාකරණ කණ්ඩායම (12)

ඒකාබද්ධ පාලනය (13)

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය (14)

මූල්‍ය වාර්තාව

ස්වාධීන විගණන වාර්තාව (15 - 27)

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (28)

විස්තීරණ ආදායම් ප්‍රකාශය (29)

කොටස් වෙනස්කම් ප්‍රකාශය (30)

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය (31-32)

ගිණුම්කරණ ප්‍රතිපත්ති (33-43)

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් (44-59)

දශ වර්ෂ සාරාංශය (60-63)

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය

නියෝජිත ආකෘති පත්‍රය

ආයතනික තොරතුරු

දැක්ම

සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කරමින් වතු කර්මාන්තයේ වඩාත්ම අභියෝගාත්මක තරඟකරුවා වීම

මෙහෙවර

ජාතික අවශ්‍යතා ආරක්ෂාකාරීව මෙහෙයවන අතරතුර සේවකයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම තුලින් සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිතා කර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

සාරධර්ම

හොඳම සේවා යෝජකයා: ගුණාත්මක නිෂ්පාදනය, ව්‍යවසායකත්වය, අගය නිර්මාණය කිරීම, ලාභදායීතාවය, පරිසර හිතකාමීත්වය සහ ආයතනික සමාජ වගකීම කෙරෙහි අවධානය යොමු කරමින් අවංක, සුදුසුකම් ලත් සහ කැපවූ කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම

තත්ත්ව සැපයුම්කරු: උසස් පාරිභෝගික තෘප්තිය සහ අප කරන සෑම දෙයක්ම අකණ්ඩව වැඩිදියුණු කිරීම

නිෂ්පාදකතාව: ඒකක සම්පත් යෙදවුම් සඳහා ප්‍රශස්ත නිෂ්පාදකතාවයක් ළඟා කර ගැනීම, හෙක්ටෙයාරයකට ඉහළම අස්වැන්නක්, තිරසාර පදනමක් මත ප්‍රශස්ත ඉඩම් පරිහරණය, නාස්තිය අවම කිරීම

ව්‍යවසායකත්වය: සෑම විටම අගය නිර්මාණය කිරීමට නව ප්‍රවේශයන් කල් තියා නව්‍යකරණය කිරීම: ව්‍යාපාරික පරිසරයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අඛණ්ඩව ප්‍රතිචාර දක්වයි.

ලාභදායීතාවය: ප්‍රාථමික නිෂ්පාදනය සහ අගය එකතු කල නිෂ්පාදන සඳහා ප්‍රශස්ත ශුද්ධ විකුණුම් සාමාන්‍යය සහ හැකි අවම නිෂ්පාදන පිරිවැය ළඟා කර ගැනීම

පරිසර හිතකාමී බව: පරිසරයට අවම වශයෙන් හානි වන හෝ හානි නොවන පරිදි සම්පත් ලබා ගැනීම

සමාජ වගකීම් කිරීම: මිනිසුන් හා පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම, යහපාලනයට ගරු

ආයතන ආකෘතිය

ඇල්කඩුව වැවිලි සමාගම 1993 ජූලි 23 වන දින 1982 අංක 17 දරණ ආයතන පනත යටතේ සම්පූර්ණයෙන්ම රජයට අයත් ආයතනයක් ලෙස පිහිට වූ සහ 2007 අංක 7 දරණ ආයතන පනත යටතේ යලි ලියාපදිංචි වූ සීමාසහිත වගකීම් සමාගමකි. 1987 දී අංක 23 දරණ රාජ්‍ය පෞද්ගලීකරණ පනත යටතේ පොදු සමාගම් බවට පත්කරනු ලබන සංස්ථා සහ රජය සතු ව්‍යාපාර පරිවර්තනය කිරීමේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් කළමනාකරණය කරන ලද ඉඩම් පවරා ගැනීමෙන් සමාගම ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරයේ රන් කොටස් හිමියා වන තනි කොටස් හිමියන්ගේ සමාගමක් ලෙස සමාගම ක්‍රියාත්මක වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය ‘‘ජනවතු පියස’’, අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් කළමනාකරණය වන කැලෑබොක්ක රාජ්‍ය වතුයායේ පහත සඳහන් වතු 10ක් සහ කොට්ටාස 2ක් පවරා ගැනීම සඳහා ඇල්කඩුව වතු සමාගම පිහිටුවීම පිළිබඳ දැන්වීම 1993 ජූලි අංක 776/13 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

ඇල්කඩුව වැවිලි සමාගම සඳහා සත්‍ය භූමි වෙන් කිරීම (අති විශේෂ ගැසට් නිවේදන අංක 776/13 – 1993 ජූලි 13) පහත පරිදි වේ.

වතුයාය/ පිහිටීම	**දිස්ත්‍රික්කය**	**භෝග**	**මුළු භූමි ප්‍රමාණය (හෙක්ටෙයාර්) යොමු අංක 1**
1. බණ්ඩාරපොළ, අලවත්ත	මාතලේ	තේ	283.00
2. ඇල්කඩුව, ඇල්කඩුව	මාතලේ	තේ සහ කරාබු	447.78
3. හුණුගල, ඇල්කඩුව	මාතලේ	තේ සහ කරාබු	264.73
4. පිටකන්ද, මාතලේ	මාතලේ	තේ	520.60
5. රත්වත්ත, උකුවෙල	මාතලේ	තේ සහ කරාබු	570.58
6. සැලගම, යටවත්ත	මාතලේ	තේ	255.00
7. හපුගස්පිටිය, මැටිහත්ත	මාතලේ	රබර්, කොකෝවා සහ ගම්මිරිස්	269.33
8. මිල්ලවාන, මැල්සිරිපුර	මාතලේ	පොල්, කොකෝවා, රබර්, ගම්මිරිස්	603.60
9. නාලන්ද, මඩවල උල්පොත	මාතලේ	රබර්, පොල් සහ ගම්මිරිස්	496.27
10. නෙලවුල්ල, පිහිඹුව	කුරුණෑගල අනු දිස්ත්‍රික්ක	රබර්, කජු සහ අඹ	358.00 (යොමු අංක 2)
11. කබරගල/ පෝන්ගල කොට්ටාසය (කැලෑබොක්ක රාජ්‍ය වතුයාය)	මාතලේ	දැව (කපුරු)	217.00 (යොමු අංක 3)
එකතුව			**4,285.89**

සටහන 01

සමාගම වෙත (ඇල්කඩුව වැවිලි සමාගම) බදු දෙන ලද භූමි ප්‍රමාණය ඇති විශේෂ ගැසට් අංක 776/13 හි සඳහන් නොවන නිසා ඉහත සඳහන් කරන ලද දත්ත, සමාගම් ගිණුම් සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ‘‘වතු ප්‍රතිසංස්කරණ ඒකකය’’ මගින් ලබා ගෙන ඇත.

සටහන 02

2001 වර්ෂයේදී අඹ, කජු සහ රබර් වලින් සමන්විත හෙල්ල ඔල්ල වතුයායෙන් හෙක්ටෙයාර් 125ක් මේසර්ස් ඇග්‍රිස්කොඩ් (පුද්ගලික) සමාගමට රු. 372,000ක වාර්ෂික කුලී පදනමක් යටතේ අවුරුදු 30ක් සඳහා බදු දෙන ලදී. සැලකිය යුතු භූමි ප්‍රමාණයක් බල නොලත් පුද්ගලයින් මඟින් අත්පත් කරගෙන ඇත (1977 සිට 2011 දක්වා). ඉතිරි භූමි ප්‍රමාණය පදුරු, කැලෑව සහ වනාන්තර රක්ෂිත වලින් සමන්විත වන අතර වර්තමානයේ මෙහි සේවකයින් නොමැත.

සටහන 03

කැලෑබොක්ක වතුයායේ හෙක්ටෙයාර් 217කින් සමන්විත කබරගල සහ පෝන්ගල කොට්ටාස 1995 වසරේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වී ඇත.

ඇල්කඩුව වතු සීමාසහිත සමාගම 100% ක්ම මෙට්‍රොපොලිටන් ආයතනයට අයත් මෙට්‍රොපොලිටන් වතු පුද්ගලික සමාගම මඟින් 1993 සිට පස් අවුරුදු ගිවිසුමක් මඟින් කළමනාකරණය විය. මෙම ගිවිසුම කල් ඉකුත් වීමත් සමඟ මෙම ආයතනයේ කළමනාකරණය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් 1999 ජනවාරි 19 වන දින ලබා ගන්නා ලදී.

පාලක කොටස් වලින් 51% ක් විකුණා 1994 සිට ප්‍රාදේශීය වැවිලි සමාගම් වල අයිතිය පෞද්ගලීකරණය කිරීම රජය විසින් ආරම්භ කරන ලදී. 1994 සිට 2004 දක්වා කාලය තුල පොදු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා අවස්ථා 6 කදී ඇල්කඩුව වතුයාය විකිණීමට ඉදිරිපත් කර ඇත. මෙට්‍රොපොලිටන් ඒජන්සි පුද්ගලික සමාගම හෝ වෙනත් කිසිදු ආයෝජකයෙකු පොදු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පිළිගත හැකි ආයෝජන සැලැස්මක් ඉදිරිපත් නොකළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇල්කඩුව වතු සීමාසහිත සමාගම භාණ්ඩාගාරයට අයත් ප්‍රාදේශීය වැවිලි සමාගමක් ලෙස පැවතුනි.

සංධිස්ථාන

සංස්ථාපිත කිරීම - (1993 ජූලි 23) - කළමනාකරණ නියෝජිත - සී/ස මෙට්‍රොපොලිටන් ඒජන්සීස් පුද්ගලික සමාගම.

1993 අගෝස්තු මාසයේදී මෙහෙයුම් කාර්යාලය කොළඹට මාරු කරන ලදී. මුළු විධායක නිලධාරීන් 8 දෙනෙක් සහ කාර්ය මණ්ඩලය 30 දෙනෙක් කොළඹ පිහිටි කළමනාකරණ නියෝජිත ආයතනය වෙත මාරු වීමට එකඟ විය. අනෙක් අය ඉතුකිරීමට රාජකාරි නොමැතිව මාතලේ කාර්යාලයේ රැඳවිණි.

තේ වතු සඳහා කණ්ඩායම් ක්‍රමයක් හඳුන්වා දීම - 1994
බණ්ඩාරපොත, ඇල්කඩුව, හුණුගල සහ පිටකන්ද වතුයායන් පිටකන්ද කණ්ඩායම ලෙසද රත්වත්තේ සහ සේලගම වතුයායන් රත්වත්තේ කණ්ඩායම ලෙසද ඒකාබද්ධ කරන ලදී.

1999 ජනවාරි 19 වන දින ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව කළමනාකරණ නියෝජිත ලෙස කළමනාකරණය භාර ගන්නා ලදී. 2002 අගෝස්තු මාසයේදී විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය කප්පාදු කල නිසා තේ කර්මාන්තශාලා 3ක් වැසී ගියේය. මෙය වර්තමාන අර්බුදයට මූලිකම හේතුව ලෙස සලකයි. තේ කර්මාන්තශාලා වැසීමට අමතරව ඇල්කඩුව වතු සමාගමේ තේ දළු පිටස්තර තේ කර්මාන්තශාලා වෙත අලෙවි කිරීමට බල කෙරෙන ලදී.

2004 වසරේදී ඇල්කඩුව වතු සීමාසහිත සමාගමේ පාලනය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කළමනාකරණ අධීක්ෂණ ඒකකය මඟින් ප්‍රධාන විධායක නිලධාරියෙකුගේ පත්වීමත් සමඟ භාර ගන්නා ලදී.

2006 ජනවාරි මාසයේ සිට ආයතනය භාණ්ඩාගාරය මඟින් 2006 දී පත්වූ පූර්ණ කාලීන සභාපතිවරයෙකු සහ අධ්‍යක්ෂක මණ්ඩලයෙන් කළමනාකරණය වේ. ඇල්කඩුව වතු සීමාසහිත සමාගම විසින් බණ්ඩාරපොළ තේ කර්මාන්තශාලාව මේසර්ස් ප්‍රයිඩ් සීමාසහිත පුද්ගලික සමාගම වෙත අවුරුදු 30 කට බදු දෙන ලදී. ඒ අනුව ඇල්කඩුව වතු සමාගම මඟින් නිෂ්පාදනය කරන තේ දළු වලින් වැඩි ප්‍රමාණයක් මෙම තේ කර්මාන්තශාලාව වෙත සපයන ලදී. 2002 තෙක් ක්‍රියාත්මක වූ ඇල්කඩුව වතු සමාගමේ තවත් තේ කර්මාන්තශාලා දෙකක් විදුලි සැපයුම අත්හිටවීම නිසා වැසී ගියේය.

2008 වසරේදී ඇල්කඩුව වතු සමාගම විසින් රත්වත්තේ වතුයාය මූලිකව අවුරුදු 10ක් සඳහා APN වතු සීමාසහිත සමාගම නමැති පෞද්ගලික ආයෝජකයෙක් වෙත බදු දෙන ලදී. ඉහත ආයෝජකයා කර්මාන්තශාලාවේ අලුත්වැඩියාවන් සඳහා යොමු වී සිටියද තවමත් මෙහෙයුම් ආරම්භ කර නොමැත.

2013 වසරේදී ඇල්කඩුව වතු සීමාසහිත සමාගම විසින් රත්වත්තේ වතුයායට අයත් පන්සල්තැන්න තේ කර්මාන්තශාලාව මේසර්ස් EOAS ඔර්ගනික්ස් (පුද්) සමාගම නමැති පුද්ගලික සමාගමට වසර 30 කට බදු දෙන ලදී. වාර්ෂික බදු කුලිය රාජ්‍ය තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම් වේ.

මූල්‍ය ඉස්මතුකිරීම්

	2016	2015	වෙනස %
මුළු ආදායම (රු.)	211,395,745	279,329,596	(24.32)%
දළ ලාභය/ (අලාභය) (රු.)	(58,355,012)	(32,656,590)	(78.69)%
අනෙකුත් මෙහෙයුම් ආදායම් (රු.)	38,753,932	38,010,205	1.96%
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ලාභය	(46,082,980)	(20,181,002)	(128.35)%
බදු රහිත ලාභය (රු.)	(62,756,178)	(26,922,929)	(133.10)%
වාර්ෂික ලාභය (රු.)	(62,756,178)	(26,922,929)	(133.10)%
දළ ලාභ සීමාව (%)	(27.6%)	(11.7%)	(135.90)%
ශුද්ධ ලාභ සීමාව (%)	(29.6%)	(9.6%)	(208.33)%
කොටසක ආදායම (ඇ.වැ.සැ) (රු.)	0.73	(1.50)	(148.67)%
මුළු වත්කම් (රු.)	1,033,762,652	999,640,322	3.41%
මුළු කොටස් (රු.)	90,068,526	329,369,132	(72.65)%
නිකුත් කර ඇති කොටස් ගණන	නැත	නැත	නැත
කොටසක ශුද්ධ වත්කම	15.00	18.29	(17.99)%
වත්මන් අනුපාතය	1:0.20	1:0.21	(0.02)%

ඉහත දත්ත 2015 දෙසැම්බර් 31 සහ 2016 දෙසැම්බර් 31 දින වලින් ගෙවුණු වර්ෂ සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා මඟින් ලබා ගන්නා ලද අතර එය එකී මූල්‍ය ප්‍රකාශන වල අදාළ සටහන් සමඟ කියවිය යුතුය.

මෙහෙයුම් ඉස්මතුකිරීම්

	2016	2015	වෙනස %
තේ (දළු) නිෂ්පාදනය (කි.ග්‍රෑ)	2,541,465	4,007,397	-36.58%
NSA (රු.)	64.58	56.63	14.04%
COP (රු.)	87.1	68.31	-27.51%
අස්වැන්න (හෙක්)	613	928	-33.94%
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	862.78	883.18	-2.31%
රබර් (කිරි) නිෂ්පාදනය (කි. ග්‍රෑ)	76,025	82,085	-7.38%
NSA (රු.)	213.95	239.00	-10.48%
COP (රු.)	369.23	335.14	-10.17%
අස්වැන්න (හෙක්)	350	290	20.69%
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	217	282.19	-23.10%
පොල් නිෂ්පාදනය (කි. ග්‍රෑ)	1,359,558	969,648	40.21%
NSA (රු.)	20.71	27.92	-25.82%
COP (රු.)	14.05	9.53	47.43%
අස්වැන්න (හෙක්)	4,672	3,492	38.64%
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	291.83	277.66	1.45%

පිරිවැටුම
රු. මිලි. 211 (2015 - රු. මිලි 279)



ලාභය /(අලාභය) බදු රහිත
ලාභය රු. මිලි 63 (2015 අලාභය - මිලි 27)



කොටසක ලාභය /(අලාභය)
අලාභය රු. 0.73 (2015 - LPS 1.50)



කොටසක ශුද්ධ වත්කම
රු. 15.00 (2015 – රු. 10.30)



ලාභය/ (අලාභය) තත්ත්වය 1993-2016 (රු.)

වර්ෂය	ලාභය / (අලාභය)	භාණ්ඩාගාර ප්‍රදාන	මුළු ලාභය/ (අලාභය) රු.
1993	(16,158,428)	-	(16,158,428)
1994	(44,076,870)	-	(44,076,870)
1995	(32,348,831)	-	(32,348,831)
1996	(43,109,305)	-	(43,109,305)
1997	(43,387,199)	-	(43,387,199)
1998	(41,795,687)	-	(41,795,687)
1999(*)	(5,305,734)	-	(5,305,734)
2000	(16,884,862)	-	(16,884,862)
2001	(32,661,127)	-	(32,661,127)
2002	(72,197,231)	168,072,927	95,875,696
2003	(83,139,468)	105,859,000	22,719,532
2004	(78,472,241)	76,100,000	(2,372,241)
2005	(35,075,378)	70,000,000	34,924,622
2006	(49,489,141)	55,000,000	5,510,859
2007	(39,536,041)	13,000,000	(26,536,041)
2008	29,490,317	-	29,490,317
2009	(62,688,625)	-	(62,688,625)
2010(**)	(4,965,702)	-	(4,965,702)
2011	(29,733,796)	-	(29,733,796)
2012	(35,168,337)	-	(35,168,337)
2013	(64,949,088)	-	(64,949,088)
2014	30,402,163	-	30,402,163
2015	(26,922,929)	175,000,000	148,077,071
2016	(62,756,178)	75,831,000	13,074,822

- ගිණුම් සඳහා අයකරන ලද භාණ්ඩාගාර ප්‍රදාන වල මුළු වටිනාකම රු. 738,862,927/-
- (*) හිටපු බැංකුකරුවන් වූ සෙලාන් බැංකුව මඟින් රු. මිලියන 25.9 ක් වූ සංචිත පොලිය අත්හැර දැමූ නිසා 1999 වසරේ අලාභය පහල ගියේය.
- (**) සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල මඟින් උපචිත ණයකර පොලිය සඳහා පෙරනිමි ගාස්තු වූ රු. මිලියන 35.06 ක් අතහැර දැමූ බැවින් 2010 දෙසැම්බර් වන විට අලාභය අඩු විය.
- අදාළ වර්ෂ සඳහා ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ අගය වෙනස් වීම (සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කල යුතුය) සහ සත්‍ය ලාභ අලාභ පහත පරිදි වේ.

  2014 - රු. 84,630,003

  2015 - රු. 680,621

  2016 - රු. 2,982,775

භාණ්ඩාගාරය මඟින් ඇල්කඩුව වැවිලි සමාගම වෙත අරමුදල් නිදහස් කිරීම 1999 – 2016

වර්ෂය	විස්තරය	ප්‍රමාණය (රු.)
1993 – 2002	උපචිත ශේෂය	168,072,927
2003	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	105,859,000
2004	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	76,100,000
2005	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	70,000,000
2006	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	55,000,000
2007	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	13,000,000
2008	-	-
2009	-	-
2010	-	-
2011	-	-
2012	-	-
2013	-	-
2014	-	-
2015	ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන	175,000,000
2016	ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන	75,831,000
එකතුව		**738,862,927**

සභාපතිතුමාගේ සමාලෝචනය



2016 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ආයතනයේ සභාපති ලෙස මා විසින් 2018 අගෝස්තු මස රාජකාරි භාරගෙන ආයතනයේ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරමි.

ඇල්කඩුව වැවිලි සමාගමෙහි පෙර කළමනාකරණ යටතේ, වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීමේදී සහ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයන් සිදු විය. කෙසේ වෙතත්, මෙම සමාගමේ සභාපතිවරයා ලෙස මා රාජකාරි භාරගත් පසු ඇල්කඩුව වැවිලි සමාගම් සංගමයේ විධිවිධාන සහ 2007 අංක 7 දරණ ආයතන පනත මත පදනම්ව වාර්ෂික වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා සහ කාලානුරූපව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට මූලික කටයුතුගෙන ඇත.

ස්තුතිය

ආයතනයේ සභාපතිවරයා ලෙස සහ ඇල්කඩුව වතු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාලෝචනයට භාජනය කල කාල පරිච්ඡේදය තුල ප්‍රධාන කාර්යාලයේ සහ වතුකරයේ කාර්ය මණ්ඩලයට සහ සේවකයින්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා මධ්‍යයේ වුවද ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා වූ කැපවීම වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.



නාලක දේවින්ද මඩවල

සභාපති

ඇල්කඩුව වැවිලි සමාගම

ආංශික තොරතුරු





තේ දළු

	2016	2015	2014	2013	2012
නිෂ්පාදනය- කි.ග්‍රෑම්	2,541	4,007	3,254	3,054	2,527
NSA - රු/ කි.ග්‍රෑම්	64.58	56.63	62.37	58.58	53.27
COP - රු/ කි.ග්‍රෑම්	(87.10)	68.31	89.42	85.73	80.33
ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු.	(22.52)	(11.68)	(27.05)	(27.15)	(27.06)
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	862.78	1,203.57	915.43	903.83	917.78

රබර් කිරි

	2016	2015	2014	2013	2012
නිෂ්පාදනය- කි.ග්‍රෑම්	76	82	94	117	116
NSA - රු/ කි.ග්‍රෑම්	213.95	239.73	249.34	353.88	404.01
COP - රු/ කි.ග්‍රෑම්	(369.23)	335.15	413.54	372.19	335.79
ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු.	(155.28)	(95.42)	(162.20)	(18.31)	68.22
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	217.00	282.19	302.29	301.97	287.47

පොල්

	2016	2015	2014	2013	2012
නිෂ්පාදනය- කි.ග්‍රෑම්	1,360	970	1,386	519	1,220
NSA - රු/ කි.ග්‍රෑම්	20.71	27.90	28.72	18.12	21.50
COP - රු/ කි.ග්‍රෑම්	(14.05)	(9.53)	(10.17)	(37.12)	(16.68)
ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු.	6.66	18.37	18.55	(19.00)	4.82
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	291.83	277.66	269.66	264.66	264.66

අධ්‍යක්ෂ මණ්ඩලය

2016 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

1. නිලූ දිල්හාර විජේදාස මහතා - සභාපති / අධ්‍යක්ෂ
2. රාමනායකගේ මල්ලිකා ජයන්ති මිය - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත
3. ජෝන් මාරින්ස්ටයින් අල්පොන්සු ඩග්ලස් මහතා - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත
4. අස්වද්දගේ ගෙදර විජේතුංග මහතා - අධ්‍යක්ෂ
5. සේන ගංගොඩතැන්න මහතා - අධ්‍යක්ෂ
6. මොහොමඩ් මොහමඩ් ෆවුස් මහතා - අධ්‍යක්ෂ

2018 ජූලි 24 දින මුදල් අමාත්‍යාංශය මඟින් පත්කරන ලද වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත පරිදි වේ.

1. නාලක දේවින්ද මඩවල මහතා - සභාපති/ අධ්‍යක්ෂ
2. රාමනායකගේ මාලික ජයන්ති මහත්මිය - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත
3. වික්‍රමසිංහ මුදියන්සේලාගේ ධම්මික තරංගනී වික්‍රමසිංහ - අධ්‍යක්ෂ/ අමාත්‍යාංශ නියෝජිත
4. මහත්මිය වන්නකුවත්ත වඩුගේ රුචිර නිශාන්ත ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ
5. සේන ගංගොඩතැන්න මහතා - අධ්‍යක්ෂ
6. නිලුෂා මනෝරි තන්ත්‍රිගේ මහත්මිය - අධ්‍යක්ෂ
7. රන්ජිත් අසෝක හේරත් මහතා - අධ්‍යක්ෂ

ආයතනයේ සමාගම් විධිවිධාන වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ගණන 2ට වඩා අඩු නොවිය යුතු අතර 7 ට වඩා වැඩි නොවිය යුතුය.සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින් ‘‘පත් කරන ලද අධ්‍යක්ෂකයින්’’ වන නිසා ඔවුන් ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යාම අවශ්‍ය නොවේ.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු හෝ ඔවුන්ගේ කාලත්‍රයින් ආයතනයේ කොටස් වලට හිමිකම් නොකියයි.

කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ රුචිකත්වය

සමාගම වෙත ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ගේ සෘජු හෝ වක්‍රාකාර බලපෑමක් ඇති නොවේ.

කළමනාකරණ කණ්ඩායම

ජේෂ්ඨ කළමනාකාරීත්වය

නිලූ දිල්හාර විජේදාස මහතා - සභාපති/ අධ්‍යක්ෂ

එස්.කේ.ඩී.සී. නවරත්නම් මහතා - වැඩබලන සාමාන්‍යාධිකාරී

කේ.එච්. වික්‍රමසිංහ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තේ)

මධ්‍ය කළමනාකාරීත්වය

ආර්.එම්.සී. විජේරත්න මහතා - ගණකාධිකාරී

එම්.එම්. මද්දගේ මහත්මිය - කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන

ඩී.ඒ. ඩැනියල් මහතා - කළමනාකාර - MIS සහ විශේෂ ව්‍යාපෘති

එච්.ඒ.බී.එස්.එන්. උඩුගම මහතා - කළමනාකාර - අලෙවි

ඒ.ආර්. මැක්ස්වර්ත් මහතා - අභ්‍යන්තර විගණක

වතු කළමනාකාරීත්වය සහ අනෙකුත්

බණ්ඩාරපොත වතුයාය

ආර්.ඒ.සී. පී. කුමාර මහතා - වතු අධිකාරී

කේ.ආර්.එස්.පී. ධර්මසේන මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

ඩී.ඒ.ටී.එස්. අතුකෝරල මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

ඇල්කඩුව වතුයාය

ආර්. දිසාගේ මහතා - වතු අධිකාරී

ඩී.එම්.එස්.ආර්. දිසානායක මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

නාලන්ද වතුයාය

සී. බී නුගවෙල මහතා - වතු අධිකාරී

හුනුගල්ල වතුයාය

සී. බී නුගවෙල මහතා - වතු අධිකාරී

පිටකන්ද වතුයාය

කේ.එච්. වික්‍රමසිංහ මහතා - වතු අධිකාරී

කේ.පී.එන්.පී. කරුණාරත්න මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

හපුගස්පිටිය වතුයාය

කේ.බී.ආර්. පෙරේරා මහතා - වතු අධිකාරී

එන්.එච්.ඒ.බී. යාපා මහතා- නියෝජ්‍ය වතු අධිකාරී

රත්වත්තේ වතුයාය

එම්.එල්.කේ.ආර්. සේනාරත්න මහතා - වතු අධිකාරී

හෂාන් අවුරට්ටියගේ මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

මිල්ලවාන වතුයාය

ඩී.එස්.එන්. පෙරේරා මහතා - වතු අධිකාරී

සේලගම වතුයාය

කේ.බී.ආර්. පෙරේරා මහතා - වතු අධිකාරී

ඒකාබද්ධ පාලන ප්‍රකාශය

ආයතනික පාලනය යනු සමාගමක් මෙහෙයවන සහ පාලනය කරන නීති, පුහුණුවීම් සහ ක්‍රියාවලි පද්ධතියයි. සමාගම මූලික වශයෙන් මෙහෙයවනු ලබන්නේ අඛණ්ඩතාවය, ආයතනික සාරධර්ම, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම මත ක්‍රියාත්මක වන ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කේතයන් මත වන අතර එම පාලන මූලධර්ම සියලු පාර්ශවකරුවන් සහ සමාගම ක්‍රියාත්මක වන පරිසරය සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට උත්සහ කරන පදනම වේ. සමාගමේ ක්‍රියාකාරකම්, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ පාර්ශවකරුවන්ගේ උනන්දුව මත සිදු කෙරේ. බැඳීම ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වෙමින් නිවැරදි භූමිකාවන්, ව්‍යුහයන් සහ තොරතුරු මතින් ශක්තිමත් වන අතර මෙය ව්‍යාපාරයේ නියාමන අනුකූලතාවය සහ තිරසාර බව සහතික කිරීම සඳහා පමණක් නොව ව්‍යාපාර වටිනාකම ඉහල නැංවීම සඳහාද දායක වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂක මණ්ඩලය අවසානයේ සමාගමේ වගකීම දරනු ලබන අතර ආයතනික පාලන ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය වේ. ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ටතම භාවිතයන් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලදී.

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකුගෙන් සමන්විත වේ.

වගකීම

එය ප්‍රධාන ප්‍රතිපත්ති සහ උපායමාර්ග අරමුණු සකසා ක්‍රියාත්මක කිරීම සහතික කරයි. මූල්‍ය තොරතුරු වල අඛණ්ඩතාවය සහ සමාගමේ අභ්‍යන්තර පාලනයේ පද්ධති වල ඵලදායීතාවය පිළිබඳ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මාසිකව පැවැත්වීමට නියම කර ඇත. මෙම රැස්වීම්වලදී මණ්ඩලය විසින් සමාගමේ උපායමාර්ගික දිශානතිය. වාර්ෂික අයවැය, සියලු ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සහ වර්තමාන සහ ප්‍රාග්ධන වියදම් වැඩසටහන් සමාලෝචනය කරයි. සෑම රැස්වීමකටම පෙර අදාළ ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙයි. 2016 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වී නොමැත.

විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනික පාලන මාර්ගොපදේශයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත් කරයි. මූල්‍ය වාර්තාකරණය, නෛතික හා නියාමන අනුකූලතා, අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය සහ බාහිර විගනකවරුන් තක්සේරු කිරීම සමාලෝචනය කිරීමට විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරනු ලැබේ. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුවේ සභාපති වන්නේ ශ්‍රී ලංකා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා වේ. විගණන කමිටු රැස්වීම කාර්තු ලෙස පැවැත්වීමට තීරණය කර ඇත. ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන මණ්ඩල සාමාජිකයාගේ සභාපතීත්වය යටතේ විගණන කමිටු රැස්වීම නියාමනය කරනු ලබයි.

සාමාන්‍යාධිකාරීතුමා, ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් සහ අනෙකුත් කළමනාකරුවන් ආරාධනය මත මෙම රැස්වීම් සඳහා සහභාගී වේ. ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ආරාධනා සහ රැස්වීම් සම්බන්ධීකරණය කරයි. 2016 වර්ෂය තුල විගණන සහ කළමනාකරණ කමිටුව 2 වරක් රැස්වී ඇත.

නීතිමය අවශ්‍යතාවයට අනුකූල වීම

සමාගමේ සංදේශ සහ රජය සතු ව්‍යාපාර කටයුතු සඳහා අදාළ වන වෙනත් නීතිරීති සහ රෙගුලාසි වලට සමාගම අනුකූල වන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සෑම උත්සාහයක්ම දරයි. සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කර ඇති බවත් 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බවත් මණ්ඩලය සහතික කරයි.

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ඇති විධිවිධාන වලට අනුකූලව ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම පිළිගනියි. මෙසර්ස්, වරලත් ගණකාධිකාරීවරුන් යන විගණනකරුවන් ඔවුන්ගේ වාර්තා වල පිටු අංක 15 හි දක්වා ඇති වගකීම් වලට වඩා මෙම වගකීම් වෙනස් වේ.

මෙම වාර්තාවේ අන්තර්ගත සමාගමේ 2016 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ සම්මතයන්ට අනුකූලව සිදු කර ඇත. එමඟින් 2007 අංක 7 දරණ ආයතන පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන් සහ කොළඹ කොටස් ගනුදෙනු වල නීති මඟින් අපේක්ෂිත තොරතුරු සපයා ඇත. පිටු අංක 15 සිට 60 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර හා අඛණ්ඩව යොදා ගෙන ඇති බවත් අදාළ ගිණුම්කරණ සම්මතයන් අනුගමනය කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරයි. මෙම සම්මත්යන්ගෙන් බැහැරව ඇති කරුණු ඇත්නම් ඒවා අනාවරණය කර විස්තර කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී එළඹී තීරණ සහ තක්සේරු සාධාරණ සහ දූරදර්ශී වේ.

සමාගමේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළි කරන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගැනීම සඳහා සමාගමට ඇති වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සනාථ කරයි. වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 2016 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවටත් අවසන් වූ වර්ෂය සඳහා වූ ලාභය පිළිබඳවත් ඔවුන්ගේ වගකීම තහවුරු කරයි.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය මත රඳා පවතියි. වැරදි අර්ථකතන හා වංචාවන්ට එරෙහිව නිරපේක්ෂ සහතිකයක් ලබා දිය හැකි තනි අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොමැති බව පිළිගන්නා අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර චෙක්පත්, අභ්‍යන්තර විගණනය, මූල්‍ය හා වෙනත් පාලනයන්ගෙන් සමන්විත වන අභ්‍යන්තර පාලන පද්ධති ඔවුන් විසින් ස්ථාපිත කර ඇති බව සනාථ කරයි. එමඟින් සියලු වත්කම් ආරක්ෂා කර ඇති බවට සාධාරණ සහතිකයක් පවතින අතර වැරදි අර්ථකථන සහ අක්‍රමිකතා සාධාරණ කාල සීමාවක් තුල වැලක්වීමට හෝ අනාවරණය කිරීමට හැකි වේ.

අනාගතයේ මෙහෙයුම් කටයුතු කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩව අවධානය යොමු කිරීමේ පදනම භාවිතා කර ඇත.

මෙසර්ස් පී.ඊ. මැතිව් සහ සමාගම සහ විගණන නිලධාරීන්ට ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා සුදුසු සහ අවශ්‍ය යැයි සලකන සමාලෝචන හා පරීක්ෂණ සිදු කිරීමට සෑම අවස්ථාවක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත. සමාගමේ විගනකවරුන් වන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලු මූල්‍ය වාර්තා හා අදාළ දත්ත සමඟ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඔවුන්ගේ මත මෙම වාර්තාවේ පිටු අංක 18 හි වාර්තා කර ඇත. මෙම මතයට පැමිණීමේදී ඔවුන් විසින් අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විමර්ශනය හා සාම්පල පරීක්ෂා කිරීම සිදු කර ඇත.

මණ්ඩලය වෙනුවෙන්



සමාගම් ලේකම්
ඇල්කඩුව වැවිලි සමාගම



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. PLA/A/EPL/01/2016/01 ඔබේ අංකය உமது இல. Your No දිනය திகதி Date 2019 අප්‍රේල් 24 දින

ඇල්කඩුව වැව්ලි සමාගම - 2016

ඇල්කඩුව වැව්ලි සමාගමේ 2016 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා විගණනය 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, කොටස් වෙනස් කිරීමේ ප්‍රකාශය සහ ගෙවුණු වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහ අනෙකුත් විස්තරාත්මක සටහන් ආදියෙන් සමන්විතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත වෙත ඉදිරිපත් කල යුතු යැයි හැඟෙන සමාලෝචනය කරන වර්ෂය සඳහා සමාගමේ කාර්ය සාධනය පිළිබඳ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දක්වා ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අනුව සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීමට සහ වංචාව හෝ දෝෂය හේතුවෙන් ඇතිවන මූල්‍ය වැරදි අර්ථකතනයකින් තොර මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලනය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වගකීම දරයි.

1.3 විගණන වගකීම

මාගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන කෙරෙහි මතය ඉදිරිපත් කිරීමයි. මා විසින් මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන සම්මතයන්ට අනුව සිදු කරන ලදී. මා විසින් සදාචාරාත්මක අවශ්‍යතා වලට අනුව මූල්‍ය ප්‍රකාශන තුල වැරදි අර්ථකථන නොපවතින ලෙස විගණනය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම මා විසින් සිදු කරන්නේද යන්න එම සම්මතයන්ගේ අවශ්‍යතාවය වේ.

මූල්‍ය ප්‍රකාශන වල ඇති ප්‍රමාණයන් සහ අනාවරණයන් සඳහා සහය වන සාක්ෂි පදනම් කරගෙන පරීක්ෂා කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් ක්‍රියා පටිපාටි රඳා පවතින්නේ වංචාව හෝ දෝෂය හේතුවෙන් ද්‍රව්‍යමය වැරදි අර්ථකථනවල අවදානම තක්සේරු කිරීම ඇතුළුව විගණකගේ තීන්දුව මත ය. එම අවදානම් තක්සේරු කිරීමේදී, විගණන ක්‍රියා පටිපාටිය සැලසුම් කිරීම සඳහා සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලනයන් විගණකාධිපති විසින් සලකනු ලබන අතර එය සමාගමේ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ මතයන් ඉදිරිපත් කිරීම සඳහා නොවේ. භාවිතා කල මූල්‍ය ප්‍රතිපත්ති වල අදාලත්වය සහ මණ්ඩලය සිදු කරන ලද සැලකිය යුතු තක්සේරු කිරීම් සහ සමස්ත මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට විනිශ්චය කිරීමද විගණනයට ඇතුලත් වේ.

මා විසින් ලබා ගන්නා ලද විගණන සාක්ෂි මාගේ මතය පිළිබඳ සාධාරණ පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා අදාළ බව මම විශ්වාස කරමි.

1.4 සුදුසුකම්ලත් මතයේ පදනම

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මත අංක 16 හි 51 වන පරිච්ඡේදහි අන්තර්ගත කරුණු අනුව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාල වාර්ෂිකව සමාලෝචනය කර නොමැත. ඒ අනුව රු. 13,535,257 ක් වටිනා මෝටර් වාහන 29ක් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇත. එසේ වුවද ඒවා තවමත් භාවිතාවේ පවතියි. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මත අංක 8 අනුව තක්සේරු කල දෝෂ සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත.

(b) ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මත අංක 39 හි 46 වන පරිච්ඡේදහි අන්තර්ගත කරුණු අනුව මූල්‍ය වත්කම් සාධාරණ අගයක් මත ගණනය කල යුතුය. කෙසේ වෙතත්, 2013 වර්ෂයෙන් පසු සමාගම සතුව පවතින රු. 44,372,810 ක ස්ථාවර වත්කම් සාධාරණ අගයකින් ගිණුම් වෙත ගෙන නොමැත.

(c) ලංකා ගිණුම්කරණ සම්මත අංක 41 හි 12 වන පරිච්ඡේදහි අන්තර්ගත කරුණු අනුව ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනා ගැනීමේදී හා වාර්තා කරන කාල සීමාව අවසානයේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් මැනිය යුතුය. කෙසේ වෙතත්, 2015 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම රු. 278,565,316 ලෙස හඳුනා ගත් වත්කම් නැවත මැනීමක් සිදු නොකර සමාලෝචනය කරන වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇත.

(d) තේ, රබර්, පොල් හා අනෙකුත් භෝග වල මෝරන කාලය හඳුනා ගැනීම සඳහා විශේෂිත ප්‍රතිපත්තියක් නොමැති අතර රු. 125,128,573 ක පිරිවැයක් සහිත එම භෝග මෝරන කාලය ඉක්මවා ගොස් ඇති නිසා සමාලෝචනය කරන වර්ෂයේදී නොමේරූ භෝග යටතේ වාර්තා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ ක්ෂයවීම් ගිණුම් වලින් ඉවත් කර ඇත.

(e) සමාගම විසින් සේවක භාර අරමුදලට 1995 දී නිකුත් කරන ලද ණයකර වල වටිනාකම රු. 5,000,000 ක් වන අතර ඒවා 2000 වර්ෂයේදී නිකුත් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් මෙම වාර්තාවේ දිනට වන විටත් ඒවා නිදහස් කර අනොමති අතර මූල්‍ය ප්‍රකාශන තුලද අනාවරණය කිරීම් සිදු කර නොමැත. තවද, 2000 වර්ෂයේ ජුනි 15 දින සිට ගෙවිය යුතු පොලිය ගිණුම් වෙත ගෙනවිත් නොමැති අතර වත්මන් වසරේ පොලි වියදම වන රු. 720,000 ක් අන්තර්ගතව සමාලෝචනය කරන වර්ෂයේ දෙසැම්බර් 31 වන විට පොලිය රු. 11,880,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

(f) 2007 වර්ෂයේදී රත්වත්තේ වතුයායේ ස්ථාපිත රු. 6,396,615 කැ පිරිවැයකින් යුතු පොල් වගාව වර්තමානය වන විට අසමත් තත්ත්වයක පවතියි. කෙසේ වෙතත්, අදාළ පිරිවැය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කිරීම වෙනුවට ඒවා නොමේරූ දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් යටතේ පෙන්වා ඇත.

(g) 2016 දෙසැම්බර් 31 දිනැති මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සමාගම වෙත ලැබිය යුතු මුදල් වල පිලිවෙලින් රු. 5,538,252 හා රු. 147,343 කැ වෙනස්කම් ඇති බව නිරීක්ෂණ කල අතර අදාළ ආයතන වලින් වෙන වෙනම ශේෂයන් සනාථ කරගෙන ඇත.

(h) 2016 දෙසැම්බර් 31 දිනට වතු මානව සංවර්ධන භාර අරමුදල වෙත ගෙවිය යුතු ප්‍රදානයන් සහ සමාගමේ ගිණුම් ශේෂයන්ට අදාලව එම ආයතන වල ශේෂයන්ගේ රු. 3,977,943 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය කරන ලදී.

(i) සේලගම වතුයායට අයත් දේපලක් රාජ්‍ය බැංකුවකට 2011 වර්ෂයේදී උකස් කල දේපලක් සඳහා ලබා ගත රු. 15,000,000 ක ණය මුදල සම්බන්ධයෙන් ගෙවිය යුතු ශේෂයක් 2016 දෙසැම්බර් 31 දිනට නොමැති බව බැංකුව විසින් සනාථ කරන ලදී. එසේ වුවද සමාගමේ ගිණුම් වලට අනුව, රු. 2,778,246ක වටිනාකමකින් යුත් ණය මුදලක් ගෙවීමට ඇති වගකීම් යටතේ දක්වා ඇත.

(j) 2009 වර්ෂයේදී රු. 2,125,614 ක පිරිවැයක් දරා කිරි ගවයින් ඇති කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ගොඩනැගිලි ඉදිකර එය ඉහත ව්‍යාපෘතිය යටතේ ප්‍රාග්ධනීකරණය කලද එය නැවතත් එම වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන පිරිවැය යටතේ ප්‍රාග්ධනීකරණය කර ඇති අතර ගොඩනැගිල්ලේ වටිනාකම සත්‍ය අගයට වඩා වැඩි වන ලෙස ගණන් බලා ඇත.

(k) සමාලෝචනය කරන වසරේ ස්ථාවර තැන්පතු පොලිය ලෙස 2015 වසරේ හා පෙර වර්ෂ වල ස්ථාවර තැන්පතු පොලිය වූ රු. 2,856,838 ගිණුම් වලට ගෙනවිත් ඇති අතර සමාලෝචනය කරන වසරේ පොලිය වූ රු. 2,332,946 ගිණුම්ගත කර නොමැත.

(l) සමාලෝචනය කරන වසරේ මුදල් ලෙස ලැබුණු රු. 2,340,664 ක පොලී ආදායම අඩුකර මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපුම් යටතේ දක්වා ඇතත් එම ආදායම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වන මූල්‍ය ප්‍රකාශයේ මුදල් ලැබීමක් ලෙස දක්වා නොමැත.

(m) සමාලෝචනය කරන වර්ෂය අවසානයේ අඩමාන ණය ලෙස වෙන්කර ඇති මුදල රු. 4,186,615 ක් වුවද එම අගය ගණනය කල ආකාරය හෝ අදාළ ණය ගැනියන් ප්‍රමාණය විගණනය වෙත ලබා දී නොමැත.

(n) ගිණුම් 10 ක ශේෂය වූ රු. 3,777,650 ක මුදල වෙළඳ හා අනෙකුත් ගිණුම් වලින් ලැබිය යුතු හෝ ඒවාට ගෙවිය යුතු ගිණුමේ අන්තර්ගත කර නොමැති අතර එය ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතේ ඇති ගිණුමකට ගෙනවිත් ඇත.

(o) ණය ගැතියන්ගේ හා ණය හිමියන්ගේ ශේෂයන් වන රු. 77,591,127 හා රු. 23,222,650 විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 සුදුසුකම් ලත් මතය

මාගේ මතයට අනුව මෙම වාර්තාවේ මතය සඳහා විස්තර කර ඇති කරුණු වල බලපෑම හැරුණු විට, ඇල්කඩුව වැවිලි සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මඟින් මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන අතර මූල්‍ය කාර්ය ඵලය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වේ.

2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරණ ආයතන පනතේ 163 (2) කොටසේ අවශ්‍යතා වලට අනුව මා පහත දැ සඳහන් කරමි:

(a) විගණන මතයේ පදනම, වපසරිය හා සීමාවන් මෙම වාර්තාවේ සඳහන් පරිදි වේ.

(b) මාගේ මතයට අනුව,

සුදුසුකම් ලත් මතයක් සඳහා පදනම් ඡේදයේ විස්තර කර ඇති කරුණු වලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ඇති අතර මගේ විභාගයෙන් පෙනී යන තාක් දුරට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 එනක 07 දරණ සමාගම් පනතේ 151 වන කොටසේ අවශ්‍යතා සමඟ සමපාත වේ.

2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීමේ පහත අවස්ථා නිරීක්ෂණය කරන ලදී.

නීති, රීති ආදිය සඳහා යොමු කිරීම	අනුකූල නොවීම
(a) 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම පිළිබඳ පනතේ අංක 5(I) ඡේදයේ II කොටස	සේවයෙන් ඉල්ලා අස්වූ හෝ සේවගෙන් විශ්‍රාම ගිය හෝ නෛතිකව සේවයෙන් ඉවත් කල සේව්‍යයෙකු යටතේ අවුරුදු 5කට නොඅඩු කාලයක් සේවය කල තැනැත්තෙකුට මාසයක කාලයක් තුල පාරිතෝෂික දීමනා ගෙවිය යුතුය.සේවකයින් 998 දෙනෙකු සේවයෙන් ඉවත් වීමෙන් පසු මාසයක සිට අවුරුදු 15 ක් දක්වා කාලයක් ගතවී තිබුනද එම සේවකයින් වෙත පාරිතෝෂික දීමනා ගෙවා නොමැත. ඒ අනුව දඩ මුදල් සමඟ සමාලෝචනය කරන වසරේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික මුදල් රු. 87,003,386 ක් වේ.

(b) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරණ පොදු මූල්‍ය චක්‍රලේඛය	රාජ්‍ය ආයතන සතුව පවතින දිරාපත් වූ සහ සේවා කල නොහැකි මෝටර් වාහන පූර්ව අරමුණක් ලෙස හඳුනා ගත යුතු අතර මෙම චක්‍රලේඛයෙන් පෙන්වා දී ඇති පරිදි එම මෝටර් වාහන මාස 3 ක කාලයක් තුල බැහැර කිරීම සිදු කල යුතුය. කෙසේ වෙතත්, 2015 දෙසැම්බර් 31 දින වන විට පැවති සේවා කල නොහැකි මෝටර් වාහන 12ක් බැහැර කිරීමට සමාලෝචනය කරන වර්ෂය අවසානය වන විටද ක්‍රියාමාර්ග ගෙන නොමැත.
(c) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරණ පොදු ව්‍යවසායකත්ව චක්‍රලේඛය	නිල වාහන දීමනාව හිමි නොවන නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස රු. 696,000 ක මුළු මුදලක් ගෙවා ඇත.
(d) 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ පොදු ව්‍යවසායකත්ව චක්‍රලේඛය හා 2009 මැයි 25 දිනැති අංක 39 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය	අනුමත වේතන හා දීමනා යටතේ දක්වා නොමැති වේතන හා දීමනා ගෙවීමට පෙර වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, සමාලෝචනය කරන වසරේ අනුමැතියකින් තොරව කම්කරු දීමනා සමාගමේ සභාපතිතුමා හා සාමාන්‍යාධිකාරී තුමා වෙත ගෙවා ඇත.

3. මූල්‍ය විශ්ලේෂණය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචනය කරන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල වල රු. 62,756,178 ක හිඟයක් පවතින අතර පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 26,922,928 ක හිඟයක් පැවතුනි. මෙයින් ගම්‍ය වන්නේ පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචනය කරන වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 35,833,250 ක කඩා වැටීමක් සිදු වී ඇති බවයි. මෙම කඩා වැටීම සඳහා ප්‍රධාන හේතුව ලෙස පෙර වර්ෂය සමඟ සංසන්ධනය කිරීමේදී සමාලෝචනය කරන වර්ෂයේ ප්‍රධාන භෝග වගා කිරීමෙන් රු. 25,698,422 කින් අලාභය වැඩි වීම දැක්විය හැකිය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 කාර්යය හා සමාලෝචනය

4.1.1.1 සමාලෝචනය කරන වර්ෂයේ අයවැය ඉලක්ක ළඟා කර ගැනීම සම්බන්ධව පහත නිරීක්ෂණ සිදු කරන ලදී

(a) සමාලෝචනය කරන වර්ෂය සඳහා රත්වත්තේ වතුයායේ තක්සේරු කල තේ කොළ අස්වැන්න කි. ග්‍රෑම්. 725,000 ක් වුවද සත්‍ය අස්වැන්න කි.ග්‍රෑම්. 421,147 ක් විය. ඒ අනුව සමාලෝචනය කරන වසරේ අපේක්ෂිත ඉලක්කයෙන් 42% ක ප්‍රතිශතයක් ළඟා කර ගත නොහැකි විය.

(b) කොකෝවා පැළ වල ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු නිසා සහ වගාවන් සඳහා රසායනික පොහොර යෝග්‍ය ලෙස නොයෙදීම නිසා හපුගස්පිටිය වතුයායේ අපේක්ෂිත වියළි කොකෝවා බීජ ප්‍රමාණය කි.ග්‍රෑම්. 5,000 ක් වුවත් අපේක්ෂිත ඵලදාවෙන් 15% ක තරම් අඩු අස්වැන්නක් පමණක් සමාලෝචනය කරන වර්ෂයේදී ලැබුණි.

4.1.1.2 ප්‍රාදේශීය වතු වල කාර්ය සාධනය පිළිබඳ පහත නිරීක්ෂණ සිදු කරන ලදී

(a) රත්වත්තේ වතුයාය

i. සමාලෝචනය කරන වර්ෂයේ තේ කොළ අස්වැන්න පෙර වර්ෂයට සාපේක්ෂව 44% ක් එනම් කි.ග්‍රෑම්. 333,404 කින් පහත වැටී තිබුණි. හෙක්ටෙයාර් 173.30 ක භූමි ප්‍රමාණයකින් 43% ක ප්‍රතිශතයක් වගාවන් සඳහා භාවිතා නොකිරීම, පැරණි වගාවන් ඉවත් කිරීමේ හා නව වගාවන් කෙරෙහි අවධානය යොමු කිරීමේ දුර්වලතා, රසායනික ද්‍රව්‍ය හා පොහොර අඛණ්ඩව නොයෙදීම මෙම අස්වැන්න අඩුවීමට හේතු වේ.

ii. රත්වත්තේ වතුයායෙන් බාහිර වවන්නන් සඳහා ලබා දෙන ලද හෙක්ටෙයාර් 108.42 ක භූමි ප්‍රමාණයෙන් තේ කොළ කි.ග්‍රෑම්. 58,529 ක ප්‍රමාණයක් සමාලෝචනය කරන වර්ෂයේදී නිෂ්පාදනය වූ අතර එම අගය 2015 වසරේදී නිෂ්පාදිත තේ කොළ ප්‍රමාණයට වඩා කි. ග්‍රෑම්. 29,676 ක අඩු අගයකි.

iii. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේ නිකුත් කරන ලද තාක්ෂණික ප්‍රකාශයට අනුව, මේරූ ගම්මිරිස් වැලකින් ලැබෙන වියළි ගම්මිරිස් අස්වැන්න වර්ෂයකට කි.ග්‍රෑම්. 1 – 2.5 අතර වේ. එසේ වුවද වතුයායේ සමාලෝචනය කරන වසරේ අස්වැන්න කි.ග්‍රෑම්. 0.3 – 0.5 අතර තරම් අඩු අගයක පැවතුනි. සමාගමේ ගම්මිරිස් අස්වැන්න අඩුවීමට හේතු වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්මතයන්ට අනුව වගාවන් පවත්වා ගැනීමට නොහැකි වීමයි.

(b) හපුගස්පිටිය වතුයාය

i. රබර් වගාව

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද දත්ත අනුව වාර්ෂිකව හෙක්ටෙයාරයකට ලැබිය යුතු රබර් කිරි අස්වැන්න කි. ග්‍රෑම්. 819 ක් විය යුතුය. කෙසේ වෙතත්, වතුයායේ අස්වැන්න ආසන්න වශයෙන් කි.ග්‍රෑම්. 278 ක් තරම් අඩු මට්ටමක පවතියි. වගාවෙන් 90% ක් පමණ මේරූ රබර් ශාක වල ඵලදායී ජීවිත කාලය ඉක්මවා තිබීම, පැරණි වගාවන් ඉවත් කිරීමේ හා නව වගාවන් වෙත අවධානය යොමු කිරීමේ දුර්වලතා හා හෙක්ටෙයාරයක රබර් ශාක ප්‍රමාණය 550 ක් විය යුතු වුවත් පවතින ප්‍රමාණය 215 ක් තරම් අඩු අගයක් වීම මෙයට හේතුව විය හැකිය.

ii. **<u>කොකෝවා වගාව</u>**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්මතයන්ට අනුව කොකෝවා ශාකයක වාර්ෂික වියළි කොකෝවා බීජ නිෂ්පාදනය කි. ග්‍රෑම්. 0.9 – 1.3 අතර අගයක් විය යුතුය. කෙසේ වෙතත්, වතුයායේ එම අගය ග්‍රෑම් 100 තරම් අඩු අගයක පවතියි. කොකෝවා ශාකයක ඵලදායී ජීවිත කාලය අවුරුදු 25 – 30 අතර වුවත් මුළු ශාක ප්‍රමාණය වන ශාක 28,100 කින් 73% ක් එනම් ශාක 20,513 ක ප්‍රමාණයකම ඵලදායී ජීවිත කාලය ඉකුත් වී තිබූ අතර අඛණ්ඩ පොහොර හා රසායනික ද්‍රව්‍ය යෙදීමක් සිදු වී නොමැත. ඒ අනුව එමඟින් අඩු අස්වැන්නක් ලැබී ඇත.

iii. **<u>පොල් අස්වැන්න</u>**

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

- වතුයායේ පොල් වගාවෙන් 50% ක ප්‍රතිශතයක අස්වැන්න නොලැබෙන අතර රසායනික පොහොර භාවිතා කර නොමැත. පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව පොල් ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න පොල් ගෙඩි 72 ක් වේ. කෙසේ වෙතත්, වතුයායේ අස්වැන්න ගෙඩි 4 – 31 අතර අඩු අගයක පවතියි.

- පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව හෙක්ටෙයාරයක තිබිය යුතු පොල් ගස් ප්‍රමාණය 158 ක් වේ. කෙසේ වෙතත්, වතුයායේ කැබලි 5 ක පවතින පොල් ශාක ප්‍රමාණය 3 -120 ක් අතර ප්‍රමාණයක් වේ. ශාක අඩුව පිරවීමට ශාක වගා කර නොමැති අතර පවතින වගාව ආරක්ෂා කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත.

- 2007 සිට 2015 වසර දක්වා කාලය තුල සමාගම විසින් ස්ථාපිත කල පොල් වගාවෙන් 31% ක් හා රබර් හා තේක්ක වගාවෙන් 12% ක් සමාලෝචනය කරන වර්ෂයේ දෙසැම්බර් 31 වන විට විනාශ වී ඇත.ප්‍රමාණවත් තරම් ජලය සැපයීමට අපොහොසත් වීම සහ අඛණ්ඩ පොහොර හා රසායන ද්‍රව්‍ය යෙදීමට අපොහොසත් වීම මෙයට හේතුව විය හැකිය. කෙසේ වෙතත්, 2007 සිට සමාලෝචනය කරන වසරේ දෙසැම්බර් 31 දින වන තුරු සමාලෝචනය කරන වසරේ දෙසැම්බර් 31 දිනට රු. 14,160,233 ක පිරිවැයක් මෙම වගාවන් සඳහා දරා ඇත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(a) සේලගම වතුයායේ අක්කර 3 රූඩ් 2 පර්චස් 22 ක ප්‍රදේශයක් පුද්ගලික සමාගමකට 2006 ජුනි 01 දින අවුරුදු 30 කට බදු දී ඇති අතර ගිවිසුමේ අඩංගු කරුණු අනුව සමාගමේ ලිඛිත අවසරයකින් තොරව එය දෙවනුව බදු දීම සිදු කල නොහැක. කෙසේ වෙතත්, බදුකරු විසින් අදාළ ඉඩම 2012 වර්ෂයේදී නැවත බදු දී ඇත. ඒ අනුව එතැන් සිට සමාලෝචනය කරන වසර අවසාන වන තෙක් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

(b) පන්සල්තැන්න වතුයායට අයත් තේ කර්මාන්තශාලාවක් 2013 වර්ෂයේදී බදු දීමට අදාළ අතුරු බදු ගිවිසුමට අනුව බදුකරුගෙන් නැවත ගෙවන රු. 1,908,000 ක පොලී රහිත තැන්පතුවක් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, සමාලෝචනය කරන වර්ෂය අවසාන වන තුරුත් තැන්පතු මුදල් ලබා ගෙන නොමැත.

(c) සමාගමේ ප්‍රධාන ශාඛාවෙන් හා වතු කම්කරුවන්ගෙන් ගංවතුර සහනාධාර ලෙස ලබා ගත් රු. 330,150 ක මුදල සමාලෝචනය කරන වසරේදී සමාගමේ බැංකු ගිණුමක තැන්පත් කර ඇති අතර එම මුදල් 2017 ජනවාරි මාසයේදී සමාගමේ සභාපතිවරයා වෙත භාර දී ඇත. එනමුත් ගංවතුර සහනාධාර ලේඛනයක් සමාගම සතුව නොමැත.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාලෝචනය කරන වසරේදී ඇල්කඩුව වතුයායේ සිදු කරන ලද කරාබු නැටි පැළ සංගණනයට අනුව 2015 වසරේ ස්ථාපිත කල ප්‍රමාණ ඉවත් කර නව ප්‍රමාණ ඇතුලත් කර ඇත. තවද, 2015 වසරේ 3,470 ක් ව පැවති කරාබු නැටි පැළ 1,523 කින් අඩු වී ඇති අතර ඒ අනුව සමාලෝචනය කරන වසරේ කරාබුනැටි පැළ ගණන 1,947 ක් ලෙස සඳහන් කර ඇත. වතුයායේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් මාසිකව වතුයායට සපයන කාර්ය සාධන වාර්තා වල සංගණනය කල දිනය වනතුරුම කරාබුනැටි පැළ විනාශ වීම හෝ ඉවත් කිරීම පිළිබඳ තොරතුරු වාර්තා කර නොමැත. සමාගම විසින් මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත.

4.4 අක්‍රීය හා අඩුවෙන් භාවිතා කරන වත්කම්

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(a) නාලන්ද වතුයායේ අක්කර 1 ක භූමි ප්‍රමාණයක ග්‍රෑෆයිට් කැනීම් සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් හා භූ විද්‍යාත්මක සමීක්ෂණ 2014 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර 2016 දෙසැම්බර් 31 වන විට ඒ සඳහා රු. 21,407 ක මුදලක් වියදම් කර ඇත. කෙසේ වෙතත්, සමාගමේ කළමනාකාරීත්වය විසින් ඉහත සඳහන් ග්‍රෑෆයිට් කැනීම 2017 දෙසැම්බර් අවසාන වනතුරුත් ආරම්භ කර නොමැත.

(b) රත්වත්තේ වතුයායට අයත් හෙක්ටෙයාර් 5.04 ක කුඹුරු ඉඩමක් හා හෙක්ටෙයාර් 13.66 ක වගා ඉඩමක් කෘෂි කටයුත්තක් සඳහා භාවිතා කිරීමක් හෝ බදු පදනම මත ලබා දීමක් හෝ සිදු නොකර අක්‍රීය තත්ත්වයේ පවතියි.

4.5 ඵලදායී නොවන ගනුදෙනු

සමාගම විසින් අවුරුදු 15ක් තිස්සේ සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල, වතු සේවකයින්ගේ අර්ථසාධක සමිතිය සහ ශ්‍රී ලංකා වැවිලිකරුවන්ගේ සංගමය වෙත මාසික දායකත්ව මුදල් නිසි ආකාරව ගෙවා නොමැති අතර සමාලෝචනය කරන වසර වන විට රු. 96,445,172, රු. 9,470,126, රු. 2,855,169 හා රු. 2,449,229 ලෙස දඩ මුදල් ගෙවීමට ඇත.

4.6 හඳුනාගත් පාඩු

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සුළු භෝග වල මිල ලැයිස්තුවට අනුව 2017 මැයි 31 දිනට වියළි ගම්මිරිස් කි.ග්‍රෑම්. 1ක සාමාන්‍ය වෙළඳපොල වටිනාකම රු. 1,398 ක් වූ අතර මෙම මිල ගණන් සන්සන්ධනය කිරීමකින් තොරව රත්වත්තේ වතුයායේ කි.ග්‍රෑම්. 1ක් රු. 850 ක මුදලකට අලෙවි කර ඇත. ඒ අනුව සමාගමේ ආදායම අඩුවීම රු. 206,048 ක් විය.

4.7 සේවක මණ්ඩල කළමනාකරණය

රහස්‍ය ලේකම්, කළමනාකරු (අලෙවි), පොදු කටයුතු නිලධාරී හා කළමනාකරු (MIS) යන නව තනතුරු සඳහා අනුමත සේවක ගණනට අමතරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පුද්ගලයින් 4 දෙනෙකු බඳවා ගෙන ඇති අතර සමාලෝචනය කරන වසරේ වේතන හා දීමනා ලෙස රු. 2,460,576 ක මුදලක් ගෙවා ඇත. තවද 2012 වසරේ සිට සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුරට ස්ථිර පදනමකින් නිලධාරියෙකු බඳවා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන ඇත.

4.8 අවිනිශ්චිත විගණන වේද

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(a) 2003 වසරේ ඉදිකිරීම් කටයුතු නිමකළ සමාගමේ මාතලේ දිස්ත්‍රික්කයේ මෙහෙයුම් කාර්යාලය වෙත කොළඹ ප්‍රධාන කාර්යාලය ගෙනයාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. එම නිසා එම ගොඩනැගිල්ල ගරාවැටෙන තත්ත්වයේ පවතියි.

(b) නෙල්ල උල්ල වතුයායේ හෙක්ටෙයාර් 354.75ක මුළු භූමි ප්‍රමාණයකින් ආසන්න වශයෙන් හෙක්ටෙයාර් 229.75 ක ප්‍රමාණයක් අයුතු ලෙස අල්ලාගෙන ඇති අතර ඔවුන් ඉවත් කිරීමට සහ එම ඉඩම් සමාගමේ භාවිතයට ලබා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

(c) වතු අධිකාරීවරුන් දෙදෙනෙකු විසින් සිදුකරන ලද වැරදි කටයුතු සම්බන්ධයෙන් විභාගයක් සිදු වන අතරතුර එම නිලධාරීන් දෙදෙනා නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර ඇත.

(d) රත්වත්තේ වතුයායේ කරාබුනැටි විකිණීමට අදාළ ටෙන්ඩරයක් පවත්වා ගැනීම මඟින් රු. මිලියන 1.5 ක මූල්‍ය පාඩුවක් සිදුවීමට අදාළ ටෙන්ඩර් 6 සාරාංශ ගත කොට පොදු ව්‍යාපාර කමිටුවට සාක්ෂි වාර්තාවක් ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් අදාළ වාර්තාව ඉදිරිපත් කර නොමැත.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය කරන ලද පද්ධතිවල සහ පාලනයේ දුර්වලතා වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇත. පහත පාලන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන අංශ	නිරීක්ෂණ
(a) ස්ථාවර වත්කම් කළමනාකරණය	බාහිර පාර්ශව වලින් ඉඩම් නිදහස් කිරීම, වාහන නඩත්තු කිරීම හා වාහන රක්ෂණ දුර්වල මට්ටමක ඇත.
(b) අයවැය පාලනය	අයවැය මඟින් ඉලක්ක ඇති කර ඇති නමුත් ඒවා ලඟා කර ගැනීමේ සුපරීක්ෂක ක්‍රියාවලිය දුර්වල මට්ටමක ඇත.
(c) ණය ගැනියන් හා ණය හිමියන් පාලනය	දීර්ඝ කාලීන ණය ශේෂයන් පියවීමට හෝ ලබා ගැනීමට ක්‍රියා කර නොමැත.
(d) පිරිස් පරිපාලනය	බඳවා ගැනීමේ ක්‍රමවේදයට පරිබාහිරව බඳවා ගැනීම් සිදු කර ඇත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

ඇල්කඩුව වැවිලි සමාගම
2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව විස්තරය

		දෙසැම්බර් 31	
වත්කම්	**සටහන්**	**2016**	**2015**
ජංගම නොවන වත්කම්		**රු.**	**රු.**
කල්බදු දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න	01	157,833,041	162,139,418
සින්නක්කර දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න	02	50,112,678	51,374,745
දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම්	03	383,698,868	361,144,790
පරිභෝජනය කල හැකි ජීව විද්‍යාත්මක වත්කම්	04	278,565,316	278,565,316
මූල්‍ය ආයෝජන	05	44,372,810	44,372,810
මුළු ජංගම නොවන වත්කම්		**914,582,712**	**897,597,079**
ජංගම වත්කම්			
ඉන්වෙන්ටරි	06	5,896,023	5,206,099
විකුණුම් හා ලැබිය යුතු දේ	07	105,897,086	95,303,379
මුදල් හා මුදල් වලට සමාන දේ	08	7,386,830	1,533,764
මුළු ජංගම වත්කම්		**119,179,939**	**102,043,243**
මුළු වත්කම්		**1,033,762,651**	**999,640,322**
කොටස් හා වගකීම්			
කොටස්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	09	180,000,010	180,000,010
රඳවාගත් ඉපැයුම්		90,068,526	149,369,122
මුළු කොටස්		**270,068,536**	**329,369,132**
